පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 10 |

# දෙවන වාර පරීක්ෂණය - 2019
# සිංහල භාෂාව හා සාහිත්‍යය - I පත්‍රය

පාසලේ නම : ...........................................................................................

ඇතුළත්වීමේ අංකය : .............................

කාලය : පැය 01 යි.

**සැලකිය යුතුය -**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.**
- **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් , ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
- **එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා , ඒවා ද පිළිපදින්න.**

Education NCP - www.edncp.lk

- **අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

01. කාර්යාලයේ සේවකයන් ඔවුන්ගේ සමහර කටයුතු සඳහා සිරිපාල **දඬමීමා කර ගත්** බව ඇතැම්හු පැවසූහ.
   1. දඬයම් කර ගත්
   2. මිත්‍රයෙක් කර ගත්
   3. උපක්‍රමශීලී ව හසු කර ගත්
   4. පහසුවෙන් අල්ලාගත්

02. නවීන පන්නයේ මෝටර් රථයක් මිල දී ගත් පසු අමල්ට **අං ඇවිල්ලා** යැයි මිත්‍රයෝ පැවසූහ.
   1. සතුටු වී
   2. පොහොසත් වී.
   3. අසනීප වී
   4. අහංකාර වී.

03. තම සිතෙහි **අබ මල් රේණුවක්තරම්වත්** තරහක් නොමැති බව නංගී පැවසුවා ය.
   1. ස්වල්පයක්වත්
   2. මල්රේණුවක තරම්වත්
   3. අප්‍රමාණවත්
   4. කෙසේවත්

- **අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. කාව්‍ය නිර්මාණයේ දී භාෂාවේ විවිධ ස්වරූප ________________කර ගැනීමට කවීන් උත්සාහ දරා ඇත.
   1. ආවර්ජනය
   2. විසංයෝජනය
   3. සුසංයෝජනය
   4. විසර්ජනය

05. ගොවීන් විසින් තම වගා කටයුතුවල දී පස ________________කිරීමට දැඩි වෙහෙසක් ගනු ලබයි.
   1. විමර්ශනය
   2. විකර්ෂණය
   3. ආකර්ෂණය
   4. සංරක්ෂණය

06. පුවතක තේමාව පාඨකයා කියවීමට ප්‍රිය කරන මාතෘකාවක් අළලා __________විය යුතු ය.
   1. සංස්කරණය
   2. සම්පාදනය
   3. විශ්ලේෂණය
   4. නිෂ්පාදනය

07. අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පෙළිය තෝරන්න.
   1. අතීරණය, අහම්බකාරක, ගම්පෙරළිය , සෙංකොට්ටං
   2. සිංහබාහු, තලමල පිපිලා, හුණුවටයේ කතාව , නරිබෑනා
   3. තොරොක්කෝව, වෙරි උයන, ගුරු ගීතය, සාරභූමි
   4. සුනේත්‍රා, කැලෑහඳ, සිරියලතා, හිගන කොල්ලා

08. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1. පෝෂණය, දුෂ්ඨ, ශිෂ්‍යාචාරය, විශිෂ්ට
   2. සියලු, සම්බන්දය, ක්‍රිඩාංගනය , මළල
   3. මර්දනය, විස්මය, දැකුම්කලු, මැතිවරණය
   4. වළාකුළු, මරණාසන්න, විකාශනය, ප්‍රදර්ශන

09. ගයනුකිත්ත, රකාරාංශය, පාපිල්ල, ඇදය අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
   1. ක්‍රමය, ගෞරව, කුඹුරු, කැත්ත
   2. කෘතිය, ද්‍රව්‍ය, නූතන , සාමය
   3. ඖෂධ , ප්‍රවීණ , රුවල , වැසියා
   4. සෞඛ්‍යය, මාගී, ක්‍රූර , භාවිතය

10. පහත සඳහන් නාම පදවල නිවැරදි ප්‍රකෘති ප්‍රත්‍ය වෙන් කොට ඇති පිළිතුර තෝරන්න.
   1. ගිර + වා
   2. දැරි + අ
   3. ග්‍රන්ථය + අ
   4. අත්ත + ඉන්

11. "මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධානය වී" මෙහි <u>සේ</u> යන පදය ,

1. තද්ධිත පදයකි
2. යුගල පදයකි
3. රූපකයකි
4. නිපාත පදයකි

12. රටෙහි සංවර්ධනය උදෙසා කැප විය යුතු ය. මෙහි <u>සං</u> යනු,

1. නාම පදයකි
2. උපසර්ගයකි
3. නිපාත පදයකි
4. ක්‍රියා පදයකි

13. බොරු කිවුවොත් පව් පිරෙයි. මෙහි කිවුවොත් යන පදය ,

1. අසම්භාව්‍ය ක්‍රියා පදයකි.
2. විධි ක්‍රියා පදයකි
3. මිශ්‍ර ක්‍රියා පදයකි
4. පූර්ව ක්‍රියා පදයකි

- **අංක 14 සිට 16 දක්වා ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.**

14. සාර්ථක කෙටි කතාවක් නිර්මාණය කිරීම **ආකස්මික** ව කළ හැකි දෙයක් නොවේ.

1. හේතුවක් නැති ව
2. පහසුවෙන්
3. ආකර්ෂණීය ව
4. කෙටි කාලයකින්

15. රචකයා තම **පරිකල්පනය** මෙහෙයවා නිර්මාණකරණයේ යෙදෙයි.

1. අත්දැකීම්
2. භාෂාව
3. ප්‍රතිභාව
4. අනුමාන සිතුවිල්ල

16. එම නගරය **ජනශූන්‍ය** ප්‍රදේශයක් විය.

1. ජනයා හැසිරෙන
2. ජනයා නොමැති
3. ජනයාගෙන් පිරුණු
4. ජනයා වෙසෙන

17. පහත සඳහන් පද අයත් වන ව්‍යාකරණ වර්ගය තෝරන්න.
අයෙක් , ඇතැමෙක් , කෙනෙක්

1. සමූහාර්ථවාචී පද
2. බහු වචන පද
3. නිත්‍ය බහු වචන පද
4. ඒක වචන පද

18. සියලු දෙනාට පොදුවේ භාවිත කළ හැකි නාම පද වර්ගය වන්නේ,

1. ගුණ නාම
2. සංඥා නාම
3. ජාති නාම
4. සර්ව නාම

19. එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගල පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

1. තාරපති - තරිඳු , නල - සුළඟ , වර - උතුම් , ගත - ශරීරය
2. සිසි - සූර්යයා , මී - මිහිරි , ඇදුරු - ගුරු , සියපත - ඔලු
3. පන්හිඳ - පහණ , ප්‍රහර්ෂය - දුක , ජනනී - මව , මිහිපල් - මීදුම
4. නුවන - ඥානය , ද්වේෂය - තරහ , හිරි - ලජ්ජාව , මුකුලිත - පරවෙන

20. විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ මෙයින් කුමක් ද?

1. සාපේක්ෂ - නිරපේක්ෂ
2. මග - නොමග
3. ආගන්තුක - නේවාසික
4. ප්‍රකාරය - පවුර

21. "සබවස කුලුණු මෙත් මුදිතා දහම් සැම" යන වාක්‍යයේ සබවස යන්නට යෙදිය හැකි වඩාත්ම යෝග්‍ය පදය වන්නේ,

1. සභාවට උචිත වචන
2. සත්‍ය වචන
3. අසත්‍ය වචන
4. නිවැරදි වචන

22. ගුරුතුමිය ගීයක් **<u>ගයා</u>** නැටුමක් **<u>නටමින්</u>** පාඩම් **<u>ඉගැන්නුවා</u>** ය.
ඉහත සඳහන් වාක්‍යයේ ඇති ක්‍රියා පද පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

1. මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා , අවසාන ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා , අවසාන ක්‍රියා , පූර්ව ක්‍රියා
3. පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , අවසාන ක්‍රියා
4. පූර්ව ක්‍රියා , අවසාන ක්‍රියා , මිශ්‍ර ක්‍රියා

Education NCP - www.edncp.lk

23. නිවැරදි අදහස දෙන වාක්‍යය තෝරන්න.
1. මෙන් , සේ , වැනි යන පද උපමාවාචී නාම නිපාත පද නොවේ.
2. "අව " යනු උපසර්ගයක් නොවේ.
3. පුන්නච්චා යනු මොණරාගල ප්‍රදේශයේ දී නිදි කෙරුවා යන්න යි.
4. ගයමින් යනු පූර්ව ක්‍රියා පදයකි.

24. පහත පද අතුරෙන් අනුක්ත පදයක් නොවන්නේ,
1. වියතෙකු 2. පුතුන් 3. ළමයි 4. මිනිසුනේ

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි ග්‍රාම නාමය තෝරන්න.
1. ල සි ක ය පු ර ති
2. ව ති ස ර ශ්‍රා පු ස්
3. රි ටි ම ග හි යා පි
4. ණ් ල ග ඩු ප ම ර

- **අංක 26 , 27 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

26. අගයක් නොමැති වීම.
1. කළුවා මාරපන ගියා වගේ
2. පරංගියා කෝට්ටේ ගියා වගේ
3. අලි මිදිවට හරක්
4. කැලේට පායපු හඳ වගේ

27. අධමයන්ට උතුම් දෙයක් පලක් නැතිකම
1. දී කිරට බළල්ලුත් සාක්කිලු
2. ඌරෝ කවද්ද කහ කෑවේ?
3. එපා වාහෙට හොඳි බෙදන්නා වාගේ
4. උණහපුළුවට උගේ පැටියා මැණිකක්ලු

28.

A. ආවර්ජනා - ගුණදාස අමරසේකර
B. බවතරණය - රත්න ශ්‍රී විජේසිංහ
C. හෙනේ විත්ති - පියසේන කහඳගමගේ
D. රතුරෝස - මහගමසේකර

A, B, C, D යෙදුම් අතරින් නිවැරදි වන්නේ ,
1. A හා C ය. 2. A හා B ය. 3. C හා D ය. 4. B හා D ය.

- **අංක 29 හා 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

29.
1. ගොන්නුන් දෙදෙනෙක් ගැල ඇද්දෝ ය.
2. ගොන්නු දෙදෙනෙක් ගැල ඇද්දේ ය.
3. ගොන්නු දෙදෙනෙකු ගැල ඇද්දෝ ය.
4. ගොන්නු දෙදෙනෙක් ගැල ඇද්දෝ ය.

30.
1. සියලු මිනිස්සු සත්‍යගරුක විය යුත්තේ ය.
2. සියලු මිනිසුන් සත්‍යගරුක විය යුතු ය.
3. සියලු මිනිසුන් සත්‍යගරුක විය යුත්තාහ.
4. සියලු මිනිස්සු සත්‍යගරුක විය යුතු ය.

31.
a) මම ගමට යමි
b) අම්මා බනිද්දී අක්කා ඇඬුවා ය.
c) ඕ තොමෝ ගමට ගියා ය.
d) මල්ලී බයිසිකල් පදිමින් ගී ගැයුවේ ය.

ඉහත සඳහන් වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණමය අනු අංගවල අනුපිළිවෙළ කුමක් ද?

A. මිශ්‍ර ක්‍රියා
B. අසම්භාව්‍ය ක්‍රියා
C. ස්ත්‍රී ලිංග ඒක වචන
D. උක්ත කර්තෘ

1. A , B , C , D
2. B , C , D , A
3. D , B , C , A
4. D , A , C , B

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ, කුමක් ද?
අපි දේශකයාගේ අදහස් අවධානයට ගත්තා.
1. අපි දේශකයාගේ අදහස් අවධානයට ගත්තෙමු.
2. අපි දේශකයාගේ අදහස් අවධානයට ගන්නෝ ය.
3. අපි දේශකයාගේ අදහස් අවධානයට ගනිමු.
4. අපි දේශකයාගේ අදහස් අවධානයට ගත්හ.

Education NCP - www.edncp.lk

33. රොබට් නොක්ස්ගේ නිර්මාණයක් වන්නේ ,

1. වාලරාමායණය  2. එදා හෙළදිව  3. ගුරු ගීතය  4. රන් රෝස

34. උපමාවක් සහිත පාඨය තෝරන්න.

1. ඇතු ඇසෑ එ මනහර බුදු රූ නැමති අමා පිරී ගියෙ.
2. අමා හැල්ලෙන් කෝ ගිණිකඳ නිවී ගිය.
3. බැමි මඩුල්ලකින් හා ආකාශයෙහි පිපී වැනී ගිය තරු කැලයක් සේ
4. බුදුන් තෙදින් සිඳී ගිය සුරා මඳ ඇත්තේ අතබහා කන්පත් සලමින් ගොස්

35. හෙළදිව අතීත ප්‍රතිරාව කෘතියෙහි නිර්මාණකරුවා වන්නේ ,

1. ආනන්ද රාජකරුණා ය.  2. ආනන්ද කුමාරස්වාමි ය.
3. ආනන්ද සමරකෝන් ය.  4. ආනන්ද ගුරුගේ ය.

36. පහත සඳහන් කවියේ හතර වැනි පදය දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

නන්නාඳුනන මෙනුවර තනි වුණ අපට
ඉන්නේ කවුද රැකවරණෙට බැල්මකට
වන්දෝ බිලින්දෝ නාඩා නැළවෙන්න
------------------------------------------------------------

1. ඇහුවා මගෙ පුතේ කිරි ඕනද උඹට
2. දරුවනේ උදේ වෙනකල් නාඩන්න
3. යම්දෝ හෙට උදේ අපි ආපසු ගමට
4. ඔබ එපා මවුනි ඇහැ පිසඳාලන්න

37. වහිනවා වහිනවා වහිනවා වහිනවා
ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා
කළු වලා කැළඹෙමින් මුදුන් වී නැගෙනවා
අකුණු ගෙඩි ගිගුම් දි විදුලි ඉරි දුවනවා

ඉහත සඳහන් පද්‍යයේ පද රචකයා වන්නේ,

1. ඩබ්.ඒ. අබේසිංහ ය.  2. ගුණදාස අමරසේකර ය.
3. එච්.එම්. කුඩලිගම ය.  4. පී.බී. අල්විස් පෙරේරා ය.

38. මොනරාගල පළාතේ "අඹ" යනුවෙන් හඳුන්වන්නේ,

1. දොඩම් ය.  2. ගස්ලබු ය.  3. අන්නාසි ය.  4. පේර ය.

39.

රුක් අත්තන පෙතන් පලු බෝ මී කහට
බක් මී දිවුල් කොළ බෝ දාඹු මී බට
හික් දඹ ලෝලු කොබ්බෑ කුරටි දෙමට
අත්වල අත අල්ලන මරු මුවා කොට

යන කවියෙන් කියැවෙන්නේ,

1. මැටි කර්මාන්තය පිළිබඳව ය.  2. හේන් ගොවිතැන පිළිබඳව ය.
3. පරිසර වර්ණනාවක් පිළිබඳව ය.  4. වී ගොවිතැන පිළිබඳව ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

ගල් යුගයේ දඩයම් දිවියෙන් ගෘහස්ථ ගොවි ජීවිතයකට සංක්‍රමණය වීමත් සමග මැටි කර්මාන්තයට අවශ්‍ය පදනම නිර්මාණය විය.

1. මැටි කර්මාන්තයට අවශ්‍ය පදනම් නිර්මාණය වූයේ ගල් යුගයෙන්, දඩයම් යුගයෙන් ගෘහස්ථ ගොවි ජීවිතයට පැමිණීමත් සමග ය.
2. මැටි කර්මාන්තයට අවශ්‍ය පදනම නිර්මාණය වූයේ ගෘහස්ථ ජීවිතයෙන් ගල් යුගයට , ගොවි යුගයට පැමිණීමත් සමග ය.
3. ගෘහස්ථ ජීවිතයට අවශ්‍ය පදනම දැමුවේ දඩයම් යුගයෙන් සංක්‍රමණය වීම නිසා මැටි කර්මානතයට අවශ්‍ය පදනම ගල් යුගයේ දී දමන ලදී.
4. ගෘහස්ථ ජීවිතයෙන් සංක්‍රමණය වීම නිසා මැටි කර්මාන්තයට අවශ්‍ය පදනම ගල් යුගයේ දී දමන ලදී.

(ලකුණු 40)

Education NCP - www.edncp.lk
PAST PAPERS WIKI

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 10 |

# දෙවන වාර පරීක්ෂණය - 2019
## සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රය

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................ කාලය : පැය **02** යි.

- **ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

**01.** අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) මල (ආ) මළ

ii. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
පුරාවිද්‍යාව අනුව අක්ශරයන්ගේ පරිනාමය ද ඉතා වැදගත් ය.

iii. පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පදයක් හා නිපාත පදයක් උපුටා දක්වන්න.
මට එය පිළිගන්නට බැරි ය.

iv. පහත සඳහන් පද්‍ය පාඨයේ තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
**බඩ වක** පිට වක සන් **වැරටිල්ලා**

v.
(අ) මහප්‍රාණ අක්ෂරයක් සහිත වචනයක් ලියන්න.
(ආ) අනුස්වාරය සහිත වචනයක් ලියන්න.

vi. පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) කාන්තාරයේ ඇති සරුබිම.
(ආ) නොයෙක් දේශවල ඇවිදින්නා.

vii. පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පද ලියන්න.
(අ) සුසිරිත (අ) ස්වාධීන

viii. පහත සඳහන් වාක්‍ය සදොස් වේ නම් ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) අම්මා ද තාත්තා ද මම ද කුඹුරට ගියෙමි.
(අ) පදිකයෝ පාරේ දකුණින් යා යුතු ය.

ix. පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) ගුරුවරුන් රැස්වීම **අමතද්දී** ළමයි අත්පොළසන් දුන්හ.
(ආ) සියලු දෙනා ම විභාගයෙන් **සමත්වෙත්වා** !

x. පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා යෙදෙන පොදු ව්‍යවහාර ලියන්න.
(අ) සකලයා (අ) හින්නෝ

(ලකුණු 2 x 10 = 20 යි)

**02.** පහත දැක්වෙන **(අ),(ආ),(ඉ),(ඊ),** යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු වනසේ රචනයක් ලියන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් යොදන්න.

(අ) ළමා සිතුම් පැතුම් හා ක්‍රියාකාරකම්වලින් සපිරි ළමා ලෝකය බොහෝ දරුවන්ට සුන්දර වකවානුවකි. නමුත් මේ වන විට අධ්‍යාපනයේ තරගකාරී බව නිසා බොහෝ දරුවන්ගේ ළමා ලෝකය ඔවුනට අහිමි වී ඇත. නූතන සන්නිවේදන මෙවලම් ද මෙයට යම්කිසි දායකත්වයක් ලබාදී ඇත.

Education NCP - www.edncp.lk

(ආ) ස්වාභාවික විපත්වලට මිනිසා ගොදුරුවීමට බලපාන ප්‍රධාන ම හේතුව වන්නේ , මිනිසා විසින් ම කරන ක්‍රියාකාරකම් සහ ඒ පිළිබඳ ව ඇති නොදැනුවත්කම ය. ගංවතුර , නායයාම් , සුනාමි වැනි ආපදාවලට මිනිස් ජීවිත මෙන් ම දේපළ ද ගොදුරු වන්නේ මේ හේතුවෙනි. මෙවැනි විපත් ඇතිවීමට හේතු හා එයින් වැළකීමට ජනතාව දැනුවත් කිරීම ප්‍රයෝජනවත් ය.

(ඉ) මිනිසත්කම හා උතුම් යහගුණ පිළිබිඹු කෙරෙන අගනා සාරධර්ම පද්ධතියක් අප සතු ය. මෙකී ගුණ ධර්ම පද්ධතිය වැඩිහිටි පරම්පරාවත් සමඟ අභාවයට යමින් පවතී. වර්තමානයෙන් බැහැර ව යන මෙම හර පද්ධතීන් නැවත ගොඩ නඟා ගුණ ගරුක සමාජයක් බිහි කිරීම සඳහා සියලු දෙනා ම උත්සුක විය යුතු ය. මේ සඳහා වැඩි වගකීමක් පාසල් පද්ධතිය දැරිය යුතු ය.

(ඊ) මම උදෑසන දසතින් ඇසෙන සුමිහිරි විහඟ ගී නද සමඟ පිබිදුණෙමි. අහස් කුස පුරා පුළුං , පෙන කැටි මෙන් සුදුවලා පටල සමුදායකි. නිවස අසලින් ගලාගෙන යන දොළ පාරත් නිල්වන් කෙත් යායත් පිසගෙන එන සිහිල් මඳ පවනත් මාගේ සිත පුබුදු කළ අතර එම උදය සිරි දසුනෙන් මම ඉතා ප්‍රීතියට පත් වුණෙමි.

(ලකුණු 25)

03. පහත දැක්වෙන පාඨය වචන 50 - 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

යොවුන් සාහිත්‍යය පිළිබඳ ලේඛක උනන්දුව පිරිහීමෙහි හේතු කිහිපයක් වෙයි. පශ්චාත් ප්‍රාථමික ශ්‍රේණිවල සිට අතිරේක කියවීමට දරුවන් යෙදවීම අද දක්නට නැති තරම් ය. දරුවා තරගකාරී අධ්‍යාපනයකට යොමු කිරීමේ හානිය අපේ ගුරු දෙගුරුන්ට තව ම අවබෝධ වී නැත. මානසික සෞඛ්‍යයෙන් යුක්ත ව නිදහසේ බාහිර කියවීම්වලින් යුතු ව ඉදිරියට යන ගැටවරයන්ගේ , ප්‍රබුද්ධතාව, සාමාජයීය සංස්කෘතික හා දේශපාලනික ගැටලුවලට ඔවුන් මුහුණ දෙන බුද්ධිමත් ආකාරය ඇතැමුන්ගේ බියට හේතු වන බව පෙනෙන්නට තිබේ. භාෂාව සාහිත්‍යය වැනි විෂයයන් කෙරෙහි ඔවුන් දක්වන අඩු සැලකිලිමත් බව ද මෙයට නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.

යෞවනයන් සිංහල පොතපතින් ඈත් වීමේ ප්‍රවණතාවයක් ද පෙනෙන්නට තිබේ, තමන්ගේ කෘති කෙරෙහි පාඨක අවධානය යොමු නොවන විට ලේඛකයාගේ උදාසීනත්වය අසාධාරණ නොවේ. දරුවන් බොළඳ කියවීමට හා නැරඹීම්වලට යොමු කරන බලවේග හඳුනා ගැනීමේ වෑයමක් ද නොපෙනේ. යොවුන් සාහිත්‍ය නිර්මාණයෙහි යෙදෙන උසස් ගණයේ ලේඛකයන් කිහිප දෙනා විසින් හෝ තමන්ගේ නිර්මාණ තමන් ඉලක්ක කොටගත් පාඨක පිරිස අතරට පිවිස තිබේ දැයි විමසන බවක් පෙනෙන්නට නැත. පාඨක රුචිය යම් යම් පරීක්ෂණ , ප්‍රශ්න කරන සහ ව්‍යාපෘති දෙක වරින්වර අසන්නට ලැබෙතත් ඒවායින් කෙරෙන අනාවරණ හෝ නිගමන හෝ පිළිබඳ පුළුල් ප්‍රචාරයක් සිදු වූ අවස්ථා ගැන සිහියට නඟා ගත නොහැකි ය. අධ්‍යාපනික හා සංස්කෘතික අවශ්‍යතා පාඨක සමාජයේ ආකල්ප , වෙනස්වන රුචි රස ආදී පැවතුම් පිළිබඳ අවධානය ලේඛකයෙකුට අවශ්‍ය ය. එසේ නිසි අවධානයෙන් තොර ව ලියැවෙන කෘති එම සාහිත්‍යාංගයේ පිරිහීමට තුඩු දෙයි.

(ලකුණු 10)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ක්‍රි.පූ. තුන්වන ශත වර්ෂයේ දී පණ්ඩුකාභය රජු විසින් සිංහලයන් තුළ ඇති කරන ලද චින්තන රටාව ක්‍රම ක්‍රමයෙන් සිංහලයන්ගේ සංස්කෘතික මුල් බවට පත්විය. වර්ෂ 1832 දී කෝල්බෲක් කොමිසම මගින් මෙම සංස්කෘතික මුල් උදුරා දමන ලදී. මෙයින් සිංහලයෝ මුල් උදුරණු ලැබූ ජනතාවක් බවට පත් වූහ.

පණ්ඩුකාභය යෙදූ ක්‍රමය අනුව රජෙකු සිටියත් නැතත් රටේ සංවර්ධනය ඉබේ ම සිදුවිය. "රාජකාරී ක්‍රමය" නමින් ඉංග්‍රීසින් විසින් හඳුන්වනු ලැබූ එම සමාජ ක්‍රමය මත හැම ගම්වැසියෙකු තුළ ම , හැම රට වැසියෙකු තුළ ම මුල් බැසගෙන තිබුණේ තමා ද ගමෙන් රටෙන් අයිතිකරුවෙකු යන හැඟීමයි. නිතිපතා වැව් , වාරිමාගී හා අනෙකුත් පොදු දේපළ නඩත්තු කිරීම. පිළිසකර කිරීම , රැක ගැනීම කාගේත් රාජකාරියේ කොටසක් විය. ඒ සඳහා බලකිරීමක් හෝ දඬුවම් කිරීමක් හෝ අවශ්‍ය නො වීය. එය ඔවුන්ට ආගම හා සමාන විය. ඔවුන් එම රාජකාරිය ඉටු කළේ මහත් භක්තියකින් හා ලැදියාවකින් යුතුව ය. රාජකාරිය දෙවියන්ගේ කාරියටත් වඩා උතුම් යයි ඔවුන් පැවසුවේ එබැවිනි. මෙම සිතුම් ක්‍රමය වටහා ගැනීමට වෑයම් නොකළ ඉංග්‍රීසිහු එය වැඩවසම් ක්‍රමයක් ලෙස සැලකූහ.

i. සිංහලයන්ගේ සංස්කෘතික මුල් බවට පත්වූයේ කුමක් ද?
ii. ඉංග්‍රීසින් විසින් රාජකාරී ක්‍රමය නමින් කුමක් හඳුන්වන ලද්දේ ද?
iii. මෙම ඡේදයට අනුව රාජකාරියට අයත් කොටස් දෙක මොනවා ද?
iv. ඔවුන් එම රාජකාරිය ඉටු කළේ කෙසේ ද?
v. පහත සඳහන් වචනවලට සමාන පද ඡේදයෙන් උපුටා ලියන්න.
(අ) සමය -
(අ) කැමැත්ත -

(ලකුණු 10)

Education NCP - www.edncp.lk

05. කොළඹට නුදුරින් පිහිටි සපුමල්වත්ත ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ , සපුමල්ගම ග්‍රාමයේ පවුල් 200 ක් පමණ ජීවත් වේ. පොදුවේ මෙම ග්‍රාමයේ වෙසෙන වැසියන්ගේ ප්‍රධාන ගැටලුවක් වී ඇත්තේ බීමට ජලය ලබා ගැනීමේ නිසි ක්‍රමවේදයක් නොමැතිකමයි. වැඩි පිරිසකට විවිධ ලෙඩ රෝග බෝ වීම, පිරිසිදු ජලය නොමැතිකම නිසාම සිදුවේ. සපුමල්ගම ආසන්නයටම ලබාදී ඇති නළ ජල පහසුකම් කඩිනමින් මෙම ග්‍රාමයටත් ලබා දෙන ලෙස ඉල්ලා සාමාන්‍යාධිකාරී , ජල සම්පාදන මණ්ඩලය සපුමල්වත්ත ලිපිනයට යවන ලිපිය ලියන්න. සපුමල්වත්ත ග්‍රාමයේ , ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් උපුල් කීර්තිපාල මහතා ඔබ යැයි සිතන්න. (මේ සඳහා වචන 100 ක් පමණ ප්‍රමාණවත් ය.)

නැතහොත්

පුලතිසිපුර යොවුන් සමාජය ළමා සෞඛ්‍යය සායනයක් පුලතිසිපුර ප්‍රජාශාලාවේ දී නොමිලේ පැවැත්වීමට කටයුතු සංවිධානය කොට ඇත. මෙහිදී දරුවන්ගේ උස, බර , ඇස් ආදිය පරීක්ෂා කිරීමත් එයට අමතර ව නිවසේ දී පෝෂණ ආහාර වේලක් සකසාගැනීමේ වැඩමුළුවක් ද සංවිධානය කොට ඇත. ඒ සඳහා ප්‍රදේශවාසී ජනතාව දැනුවත් කිරීමට සුදුසු අත් පත්‍රිකාව සකස් කරන්න. (මේ සඳහා වචන 100 ක් පමණ ප්‍රමාණවත් ය)

(ලකුණු 15 යි)

Education NCP - www.edncp.lk

PAST PAPERS WIKI

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# දෙවන වාර පරීක්ෂණය - 2019
## සිංහල භාෂාව හා සාහිත්‍යය - III පත්‍රය

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................ කාලය : පැය **02** යි.

- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.**
- **1, 2, 3, 4 ප්‍රශ්නවලටත්, 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත ලකුණු ගණන 80 කි.**

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. අ) පන්සිය පනස් ජාතක පොත රචනා කර ඇති සියවස නම් කරන්න ?
ආ) පන්සිය පනස් ජාතක පොත සිංහලයට නැගීමට අනුග්‍රහය දැක්වූ ඇමතිවරයා කවුද ?

ii. "අවුරුදු දහයකින් මුළු ගම ම අලින්ට යනවාට කිසිම සැකයක් නෑ."
අ) මෙය කාගේ සිතුවිල්ලක් ද?
ආ) ඉහත ප්‍රකාශය ඇතුළත් නවකතාව කුමක් ද?

iii. සුන් එ තතින් එ සඳ
පසු කැර **සුරන්** වෙණ නද
-------------------------------------------------------
නික්ම පැතිරෙත **දසත** විනිවිද

අ) මෙම කවියේ තුන්වන පේළිය සම්පූර්ණ කරන්න.
ආ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

iv. "ගං ඉවුරේ අලි ඇට නරි අදිනවා කියලා අනිත් අලි ගගේ නාන්නේ නැතුව අරිනවා ද? "
අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරෙක් ද?
ආ) මෙසේ පැවසීමට හේතුව කුමක් ද?

v. අ) ජාතක පොත ඇසුරු කර ගෙන රචිත ගී කාව්‍යයක් නම් කරන්න.
ආ) ජාතක කතා අතර දීර්ඝතම ජාතක කතාව කුමක් ද?

vi. "මම පමාවක් නැත්තෙමි. තෙපි උකටලි නො වැ නොපමා වැ වසව"
අ) ඉහත ප්‍රකාශය කළේ කවු ද?
ආ) "උකටලී" යන්නෙහි අර්ථය ලියන්න.

vii. අ) ගුත්තිල කාව්‍යයෙහි පද්‍ය සංඛ්‍යාව කීය ද?
ආ) ගුත්තිල කාව්‍ය කතුවරයාගේ ගුරුවරයා නම් කරන්න.

viii. රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
මිණි බරණින් සැදු මුත් ගත නොදිරද්ද
-------------------------------------------------------

අ) සිව්වන පද පේළිය සම්පූර්ණ කරන්න.
ආ) මෙහි "මිණි බරණින්" යන්නෙහි අර්ථය ලියන්න.

ix. අ) "බැද්දේගම" නවකතාව සිංහලට අනුවර්තනය කළේ කවරෙක් ද ?
ආ) එතුමා විසින් රචනා කළ වෙනත් කෘතියක් ලියන්න.

Education NCP - www.edncp.lk

x.

අ) ජනකවියට අනුරාධපුර සමය දක්වා ගිය ඉතිහාසය ඇති බව දැක්වෙන පාඨය ඇතුළත් වන්නේ කවරක ද?
ආ) කෙළි සෙල්ලම් ඇසුරෙන් නිර්මාණය වූ ජනකවි වර්ගයක් නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20 යි)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. "මියුලු නුවර රාජ්‍යය නම් ඉතා ස්වල්ප ය. සියලු දඹදිව රාජ්‍යය අපට සෑහෙයි. එක් රාජ්‍යයකින් අපට කාරිය කිම් දැ? "
අ) ඉහත ප්‍රකාශය කා විසින් කා හට පවසන ලද්දක් ද?
ආ) මේ හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

ii. යටැසින් ලන බැල්මෙන් **සුර** **විලසී**
වෙසෙසින් දන මන මත් කැර **එකසී**
අහසින් බැස රඟ ගත් රඟ කෙලෙසී
දිසි මෙන් විය විදුලිය සිය දහසී

අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.
ආ) ඉහත සඳහන් කවියෙහි අන්තර්ගත උපමාවක් ලියන්න.

iii. ඇඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

අ) සමස්ත කවියෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.
ආ) ඉහත කවියෙහි ඇතුළත් ආප්තෝපදේශයක් උපුටා දක්වන්න.

iv. "මං බොහෝම කරදර විඳගෙන ආවේ එයා සොයන්න. එයා මේක ඇතුළේ ඇති."

අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කා හට පවසන ලද්දක් ද?
ආ) "එයා" යනුවෙන් හඳුන්වන්නේ කවුද?

v. පනසිළු වීණා නද පසු බැස්වූ
මන් පිනවන වෙන නදයෙන් තොස් වූ
නන් දන කැන් දුටුව ද බිය සිස් වූ
මින් රළ වූත් ගං වෙරළට රැස් වූ

අ) මෙම පද්‍ය හා සම්බන්ධ අවස්ථාව කුමක් ද?
ආ) ඉහත පද්‍යයෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(ලකුණු 4 × 5 = 20 යි)

03. උම්මග්ග ජාතක කතාවේ සාර්ථකත්වය හේතුවී ඇති ,

අ ) චරිත නිරූපණය,
ආ) අවසථානුකූල උපමා භාවිතය නියමිත කතා කොටස ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

හානා හීය පානා අඬහැරෙන් දැනේ පද්‍ය පන්තිය ඇසුරෙන් ,
අ ) මනා සංයමයකින් උපදෙස් දීමත් ,
ආ) කාව්‍යාලංකාර යොදා ගැනීමත් ජන කවියා සතු දක්ෂතාවයකි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

( ලකුණු 15 යි )

Education NCP - www.edncp.lk

04. "බැද්දේගම" නවකතාවෙහි එන පුංචිමැණිකාගේ චරිතය,

අ ) බැද්දේගම වැසියන්ගේ ආදරයට පාත්‍ර වූ චරිතයක් ලෙසටත්,

ආ) ආත්ම ශක්තියෙන් උතුරා ගිය, චරිත ලක්ෂණ පෙන්නුම් කළ ආකාරයත් නිරූපණය කරන චරිතයකි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසීමට ලක් කරන්න.

**නැතහොත්**

ගුත්තිල ජාතක කතාව කාව්‍යයට නැඟීමේ දී

අ) සරල බස් වහර ද

ආ) කාව්‍යමය වියත් වහර ද මනාව ගළපා ගන්නට කවියා සමත්වී ඇත. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

( ලකුණු 15 යි )

- **05, 06, 07 යන ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**

05. අවස්ථෝචිත විරිත් භාවිතය ගුත්තිල කාව්‍යයේ රසය උද්දීපනය කිරීමට හේතු වී ඇත. උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

06. චිත්ත රූප මැවෙන සේ අවස්ථා නිරූපණය කිරීමට ජාතක කතාකරු සමත්කම් දක්වයි. උම්මග්ග ජාතකයේ නියමිත කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.

07. බැද්දේගම විසුවෝ අසරණ ජීවිත ගත කළහ. පුංචි මැණිකාගේ චරිතය ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

Education NCP - www.edncp.lk

PAST PAPERS WIKI


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440